තහංචි මැද්දෙන්
2007.04.29

# දොන් බොලාස් ගේ මරණය සහ ජනමාධ්‍ය සහෝදරත්වය

දොන් බොලාස් *ඇරිසෝනා රිපබ්ලික්* නම් පුවත්පතෙහි වාර්තාකරුවකු විය. පිටපත් 340,000 ක අලෙවියක් තිබූ එය ඇමෙරිකා එක්සත් ජනපදයේ නිරිතදිග ප්‍රධානතම පුවත්පත් විය. එහි අයිතිකරුවූයේ මුල් බුෂ් ජනාධිපතිගේ උප ජනාධිපතිවරයාට ඥාතීත්වයක් තිබූ ඉයුජින් පුලියම් නම් අයෙකුට ය. නමුත් පුවත්පතෙහි සංස්කරණ පිලිවෙත ඉතා ඍජු විය. අනර්ඝ වාර්තාකරණය සඳහා එය නමක් දිනා ගෙන තිබුණි.

බොහෝ වාර්තාකරුවන්ගේ නමින් ***ඇරිසෝනා රිපබ්ලික් හි*** සෑමදාම වාගේ වාර්තා පළ වූ නමුත් දොන් මින් පළ වූයේ ඉද හිට ය. ඒවා දිගු විස්තර සහිත සමහර විට කියැවීමට සිත් නොදෙන තරමේ ඒවා විය. ඔහුට ආවේණික වාර්තාකරණ ශෛලියක් තිබුණි. ඇරිසෝනා ප්‍රාන්තයේ ඉඩම් හබ සහ ග්‍රේහවුන්ඩ් තරඟ පිලිබඳ ඔහු ලියූ වාර්තා කියැවීමට නීති දැනුම අවශ්‍ය වන තරම් විය.

දොන් නඩු හබයන්ට මුහුණ දෙන්නට වනු ඇතැයි අපේක්ෂාවෙන් තමාගේ සියලුම සටහන් ද දුරකථන සංවාද ද හඬ පටි ද රැක ගත්තේ ය. සමහර අවස්ථාවන්හි දී යමකු සමඟ සාකච්ජාවක් කිරීමෙන් පසු එම විස්තර එනම් වේලාව ස්ථානය නම යනාදිය වෙනම ලියා එය තමා නමට තැපැල් කළේ තමා අතුරුදහන් වුවහොත් යැයි සිතා ය. සිය කාරය නවතා යන විට කවරකු හෝ ඇන්ජිමට යමක් කළ හොත් දැන ගනු පිණිස බොනට්ටුව මත සෙලෝටේප් පටියක් වැනි යමක් තැබූයේ ය.

*ගවේශණාත්මක ජනමාධ්‍යකරුවෝ සහ කතුවරු* යන එකතුවේ ආරම්භකයකු වූ දොන් ගවේශණාත්මක ජනමාධ්‍යවේදියකු විය. නඩු පවරන සහ මරා දමන බවට දිගින් දිගටම එල්ල වූ තර්ජනයන්ට මුහුණ දීමට දොන් සැළසුම් කළේ එළෙස ය. ඔහුට පමනක් නොව ඔහුගේ බිරිඳට සහ දරුවන්ට ද මරණ තර්ජන එල්ල විය. ඔහු සැලුනා නම් සැලුනේ එවිට ය. ඇත්ත වශයෙන්ම ඔහු දිරිමත් පත්තර කාරයකු විය.

1976 එක් උදෑසනක දොන් ඇරිසෝනා සෙනට් සභාවේ වාර්තාකරණයක යෙදී සිටින විට දහවල් කෑමට අසළ හෝටලයකට පැමිණෙන්නයි දුරකථන ඇමැතුමක් ලැබුනි. ඔහු එහි ගිය නමුත් ආරාධනය කළ පුද්ගලයා නොපැමිණියෙන් ටික වේලාවක් රැඳී සිට දොන් සුදු පැහිති ඩට්සන් සෙඩාන් වර්ගයේ වූ සිය කාරය වෙත ගියේ ය. එකවරම බිහිසුනු පිරිමකට ඇති විය. පොලීසිය එය දුරස්ථ පාලකයකින් කළ පිපිරුමක් බව නිගමනය කළේ ය.

දෙපා සහ දෙඅත් ඉවත් කෙරුණු දොන් සතියක් රෝහලේ ජීවත්ව 1976 ජූනි 13 දා මිය ගියේ ය.

දොන් ඝාතනය කිරීම ඇරිසෝනාවේ සංවිධානාත්මන අපරාධකරුවන් කළ මහත්ම වරද බවට පත් විය. නිව්ස් ඩේ පුවත්පතෙහි බොබ් ග්‍රීන්ගේ නායකත්වය ඇතිව *ගවේශණාත්මක ජනමාධ්‍යවේදියෝ සහ කතුවරු එකතුව* පුවත් පත් 28කින් වාර්තාකරුවන් 38 දෙනෙකු දොන් බොලාස් ගේ මරණය ගවේශණය කිරීමට වහාම යෙදවීය. ඔව්හු එම කාරියට බැස්සේ සිය සගයාගේ මරණයේ කැක්කුමිනි.

එහි ප්‍රතිඵලය කොටස් 23කින් සමන්විත දීර්ඝ වාර්තාකරණයක් සහ **ද ඇරිසෝනා ප්‍රොජක්ට්** නම් ග්‍රන්ථයක් වශයෙන් එළි දුටුවේ ය. එය විශේෂ පුලිට්සර් ත්‍යාගයක් ද දිනා ගත්තේ ය. මෙම ගවේශනය අද ද ඇමෙරිකානු ජනමාධ්‍ය ඉතිහාසයේ අද්විතීය ස්ථානයක් ගනී.

අද ඇරිසෝනාවේ සංවිධානාත්මක අපරාධ එදා තත්ත්වයේ හුදු සෙවනැල්ලකි. ඒ ජනමාධ්‍ය සහෝදරත්වයට ස්තුතිවන්නට ය.

ඇසුර: http://www.rthk.org.hk/mediadigest/20030515_76_79219.html

# මරණ සහ තර්ජන සහ අපේ සහෝදරත්වය

මේ සමගම පසුගිය සතියේ ඩේලි මිරර් කතුවරියට එල්ල වු දුර කථන තර්ජනයට අපේ ජනමාධ්‍ය දැක් වු පිළිවෙත සංසන්දනය කර බැලීම වැදගත් ය.

අපේ සමහරක් ජනමාධ්‍ය බැලූයේ සිදුවීම දෙස නොව තර්ජනය කළ පුද්ගලයා දෙස ය. එම තර්ජනය  ජනාධිපති සොයුරු ගෝඨාභය රාජපක්ෂ ගෙන් නොව ඇමති නිමල් සිරිපාලගෙන් හෝ වෙනත් එවැනි ඇමැතිවරයෙකුගෙන් පැමිණියේ නම් බොහෝ ජනමාධ්‍ය එම තර්ජනය එක එල්ලේම පතුරු ගසන්නට තිබුනි. දෙසතියකට පෙර අමාත්‍ය නිමල් සිරිපාල ගේ පිස්සු බලු එන්නත් කතාවට ජන මාධ්‍ය එක පැහැර පහර දුන්හ.

දැන් මෙම තර්ජනය පැමිණියේ ආරක්ෂ ලේකම්ගෙන් නිසා සිදු වූයේ එම තර්ජනය වාර්තා කළ අය ද කතුවරිය ද කොටි සංවිධානයේ වක්‍ර සහායකයින් ලෙස සමහරක් ජනමාධ්‍ය මගින් ම හංවඩු ගැසීම ය.

ආරක්ෂ ඇමැතිවරයාම කියා සිටියේ මෙම චෝදනාව එල්ල කරන්නේ එල්ටීටීඊ සංවිධානයට වක්‍රව උදව් කිරීමට බව ය. ඉන්පසු  කරුණා අම්මාන් ද කියා සිටියේ තමන්ට චෝදනා කරන්නේ එල්ටීටීඊ සංවිධානයට උදව් කිරීමට බව ය.

විවේචනාත්මක අදහස් දරන සියළු දෙනාම මත මෙම ලේබලය  ඇලවීමේ කොන්ත්‍රාත්තුව බාර ගෙන තිබෙන්නේ ස්වාධින විය යුතු නමුත් වන්දි භට්ටයන්ගෙන් පිරවූ ආණ්ඩුවේ දේශපාලනයට යටත් රාජ්‍ය ජනමාධ්‍යයන් ය. පසුගිය කාලය පුරා මෙම වන්දිභට්ට රාජ්‍ය ජනමාධ්‍ය කුලී හේවායන් විසින් විවිධ පුද්ගලයින් අරභයා ලියන ලද වෛරී සහ අවලාදාත්මක වාර්තා වෙනම සමීක්ෂනයකට තරම් ය.

ජනමාධ්‍යවේදිනී පරමේශ්වරීට එම ලේබලය ඇලවුයේ අනෙක් සිංහල පුවත් පත් ද සමග ඔවුන් ය. එමෙන්ම නාවික නිලධාරී  රෝහන ගමගේට එම ලේබලය ඇලවූයේ ඔවුන් ය. මංගල සමරවිරට සහ ශ්‍රීපති සූරියආරච්චිට එම ලේබලය ඇලවුයේ ද ඔවුන් ය.

නමුත් ඒ සියල්ල අමූලික බොරු බව දැන් සනාථ වී හමාර ය. සිංහල කොටියා යන යෙදුම ප්‍රචලිත  කිරීම පිටුපස ඇති එක් අරමුණක් නම්  සියලු විවේචනයන් හෙළා දැකීම පිනිස එය යොදා ගැනීම බව දැන්  සැකයකට ලක් කිරීම සාධාරණ ය.

අමාත්‍ය මර්වින්ද සිල්වා දිගින් දිගටම ජනමාධ්‍ය විරෝධි පිළිවෙතක් ගෙන දේශපාලනඥයෙකි. 1999 දී ඔහු දිවයින කාර්යාලයට අත් බෝම්බයක් දමා ගසන බවට තර්ජනය කලේ ය. 2005 ජූලි මාසයේ දී ස්වර්ණවාහිනී සහ එම්.ටී.වී. රූපවාහිනී සේවාවන්ට එරෙහිව පහත් පෙළේ චොදනා එල්ල කොට එම්ටීවී ආයතනයට විරුද්ධව වෛර ව්‍යාපාරයක් ගෙන ගියේ ය. 2006 අගොස්තු 18 දා නුගේගොඩ දී පවත්වන්නට යෙදුනු සාම රැළියක් කඩා කප්පල් කිරීමට ක්‍රියා කලේ ය. එහිදී ජනමාධ්‍යවේදීන් දෙදෙනෙකුට පහර දුන්නේ ය.  දෙසතියකට පෙර බඩුමිල

ඉහළ යන බව ලියන්නේ අනුන්ගෙන් කන ජනමාධ්‍යවේදීන් යැයි තර්ජනාත්මක අපහාසයක් කළේ ය. දැන් දිවයින පුවත්පත කැළනියේ විකිණීමට නොදෙන බවට තර්ජනය කරයි.

හෙට අනිද්දා වන විට අමාත්‍ය මර්වින්ද සිල්වා මහතා ද කියනු ඇත්තේ තමන්ට විරුද්ධව ප්‍රකාශ නිකුත් කරන්නේ එල්ටීටීඊ හිතවාදීන් බව ය. ඇත්ත වශයෙන්ම ඔහු උග්‍ර එල්ටීටීඊ විරෝධියෙකි. එබැවින් ඔහු වරදක් කළත් ඉවසා සිටිය යුතු ය යන තර්කය ද ගෝඨාභය රැක ගැනීමේ තර්කයට යම් දුරකට සමාන ය.

ප්‍රජාතන්ත්‍රවාදී පමිතීන්ගෙන් නොව අපේ දේශපාලන සහ වාර්ගික ලැදියාවන්ට අනුව මානව හිමිකම් සහ මාධ්‍ය නිදහස මනින තාක් දුරට තනි කොට පහර දීමට ජනමාධ්‍ය නුරුස්නා බලවේගයන්ට අවස්ථාව ලැබේ. කණගාටුවකට මෙන් අද සිදුවන්නේ එය යි.

ජනමාධ්‍යවේ දී සිවරාම් පැහැර ගෙන ගොස් මරා දමා මෙම 29 දාට දෙවසරකි. ඔහුගේ පැහැර ගත් ජංගම දුරකථනයේ සිම් කාඩ් පත ලඟ තිබී හමුවූ පුද්ගලයා අද නිදහස් ය. පැවැරූ නඩුවට වූ දෙයක් නොදනී. මේ ෂති අන්තයේ කවරකු හෝ ඒ ගැන ගවේශණයක් වාර්තාකරනු ඇත්දැයි පත්තර පෙරළා බලන්න.

**සුනන්ද දේශප්‍රිය**